# පරිසරය රැක වගාවන් රකිමු

අධික ලෙස කෘමිනාශක භාවිතා කිරීමෙන් අනාගතයේ දී මුහුණ දීමට සිදුවන භයානක ප්‍රතිඵල පිළිබඳව අද අපේ රටේ ජනතාව අතර මහත් ආන්දෝලන යක් ඇතිවී ඇති බව පෙනේ. එමෙන්ම මේ රටේ සෑම ජන සංනිවේදන මාධ්‍යයකින්ම මෙහි ඇති භයානක තත්වය පිළිබඳව පැහැදිළි කර දීම ඉතා කාලෝචිතය.

ඉවක් බවක් නැතිව කෘමිනාශක යෙදීමෙන් ඇතිවන අවසන් ප්‍රතිඵලය බිහිසුනුය. එයට හේතුව නම් ලෝකයේ මනුෂ්‍ය සංහතියට අංග විකලත්වයට සහ විකෘති භාවයට පත්කල හැකි බලයක් මේ කෘමිනාශක සතුව තිබීමයි. කෘමිනාශක විශ ද්‍රව්‍යය විවිධ මාර්ග යෙන් අපේ ශරීරයට ඇතුල් වීම නොවැලැක්විය හැකිය.

තවත් අංශයකින් බැලුවොත් ස්වභාව ධර්මයේ දයාදයක් වශයෙන් අපට ලැබී ඇති මනහර ඇල දොල ගංගා ආදියෙහි ජීවත් වන සියළුම මාළු වර්ග වඳවී යෑමේ තර්ජනයක් මේ කෘමිනා ශක යෙදීමෙන් ඇති වේ. ඇත්ත වශයෙන්ම දැනටමත් ගම්බද සමහර මාළු වර්ග වඳ වී ගොස් අවසානය.

මෙසේ කෘමිනාශක යෙදීමෙන් අපට හානිකර කෘමීන් විනාශ වී යනවාත් සමගම ප්‍රයෝජනවත් සතුන්ද වඳවී යන බව අවබෝධ කර ගත යුතුය.

මේ කරුණු ගැන සලකා බැලීමේදී කෘමිනාශක භාවිත යෙන් තොරව අපේ වගාවන් ආරක්ෂා කර ගැනීමේ මාර්ගයක් ඇත්තේ එය ඉතා වැදගත්ය. කෘමි නාශක භාවිතයෙන් තොරව වගා වන් ආරක්ෂා කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියා පිළි වෙලක් කෘෂිකර්ම දෙපාර්තමේන්තු ව මගින් ප්‍රකාශයට පත් කර ඇත. මෙය 'ඒකාබද්ධ කෘමි පාලන සැලැස්ම' නමින් හැඳින් වේ. මෙහි ඇතුලත් සමහර ක්‍රියා පිළිවෙලක් තවම අපේ රටේ අනුගමනය කල නොහැකි ය. ඒ අතර සමහර ඒවා පර්යේෂණ මට්ටමේ පවතින බවද සඳහන් කළ යුතුය.


කිරිදිවැල
**සිරිවර්ධන රත්නායක**
විසිනි


මේ සැලැස්ම අනුව කෘමීන් පාලනය කරගන්නා ක්‍රම කීපය කට බෙදිය හැක.

1. කෘෂිකාර්මික ක්‍රම
2. යාන්ත්‍රික ක්‍රම
3. දේශගුණික ක්‍රම
4. ජීව විද්‍යාත්මක ක්‍රම
5. කෘමීන් මගින් පාලනය.

**1. කෘෂිකාර්මික ක්‍රම—**

(අ) භෝග මාරුව අනුගමනය කිරීම.

(ආ) මිශ්‍ර වගාව :—මෙම ක්‍රම යෙන් සිදුවන්නේ හානිකර කෘමීන් අතරමං කිරීමකි. එක් එක් භෝගයට ආවේණික සුවඳක් ඇත. මේ සුවඳ අනුව එක් එක් භෝගයට හානිකර කෘමීන් ඈත සිට සුවඳ ඔස්සේ භෝගය කරා පැමිණේ. නමුත් භෝග කීපයක් එකට වගා කලවිට එක් එක් භෝගයන්ගේ ආවේණික සුවඳ මිශ්‍ර වීමෙන් භෝගය තිබෙන ස්ථානය සොයා ගැනීමට කෘමීන්ට නොහැකි වේ.

(ඇ) උගුල් වගාව :— මෙයින් අදහස් කෙරෙන්නේ අප වගා කිරීමට බලාපොරොත්තු වන භෝගය අයත් කුලයේ වෙනත් භෝගයක් එම ඉඩමේ තැන තැන වගා කිරීමයි. නියමිත භෝගය වගා කිරීමට පෙර මෙම භෝගය ඉඩමේ වගා කල විට එම ප්‍රදේශයේ සිටින එම කුලයේ ශාකයන්ට හානිකර සියළුම කෘමීන් එම උගුල් වගාව කරා ඇදේ. මේ අවස්ථා වේදී සියළුම පැලෑටි උදුරා දමා ගොඩවල් ගසා ගිනිතබා විනාශ කර දමන්න. එවිට සියළුම කෘමීන්, බිත්තර, කෝෂ ආදිය විනාශ වී යයි. ඊට පසු අවශ්‍ය භෝගය ඉඩමේ වගා කිරීම කල හැක. එම වගාවට කෘමි හානි බොහෝ දුරට අඩුවේ.

(ඉ) පස ඇවිස්සීම :—භෝග යක් ඇති විට පස ඇවිස්සීමෙන් පසේ කෝෂ ගත වන කෘමීන්ගේ කෝෂ සූර්යාලෝකයට නිරා වරණය වීමෙන් විනාශ වි යයි.

(ඊ) ඝනව වැපිරීම:—උදාහරණ යක් වශයෙන් කුඹුරක වැඩිපුර වී වැපිරුවේ යයි සිතමු. මෙම වගාවට පුරුක් පණු හානිය ඇති වේ. මෙය ඇති වූ විට ගොයම් ගසේ ගොබය කොටස මැරී යයි. (මළ හදවත) මෙසේ මැරී ගිය සියළුම ගොයම් ගස් උදුරා දමන්න.

පුලුස්සන්න. මේ සෑම ගසකම පුරුක් පණුවන් සිටින අතර එවිට ඔවුන්ද විනාශ වී යයි. එවිට නැවත බෝවීම සඳහා පුරුක්පණු සලබයින්ව බිහිවීමක් නැත. මේ ක්‍රමයට ජීවන චක්‍රයේ අතරමැදි අවස්ථාවක් සම්පූර්ණයෙන් විනාශ කර දැමීමෙන් හානිකර කෘමීන් අඩුකර ගත හැක.

(උ) කෘමිනාශක පැල වගා කිරීම :—'පයිරත්‍රම්' වැනි කෘමි නාශක පැල වර්ග වගාවේ තැනින් තැන වගා කිරීමෙන් කෘමීන්ගේ පැමිණීම අඩුකරගත හැකිය.

(ඌ) නියමිත කාලයට වගා කිරීම.

(එ) සමබර පොහොර මිශ්‍රණ යෙදීම :—උදහරණයක් වශයෙන් වී වගාවේදී මූලික පොහොර, මඩ පොහොර යෙදීමෙන් පැල මැක්කන්ගේ හානිය මර්ධනය කර ගතහැක.

(ඒ) ඔරොත්තු දෙන වර්ග වගා කිරීම :—උදහරණයක් වශයෙන් ගොක් මැස්සාගේ හානිය හෙවත් රිදී ගොබ රෝගයට බී.ජී. 400–1 වී වර්ගය ඔරොත්තු දෙයි.

2. යාන්ත්‍රික ක්‍රම—

(අ) අතින් අල්ලා විනාශ කිරීම.

(ආ) පහත් උගුල් භාවිතය.

(ඇ) ලාටු උගුල් භාවිතය.

3. දේශගුණික ක්‍රම—

(අ) උෂ්නත්වය වැඩි කිරීම :—බීත්තර කැදල් සහ කෝෂ විනාශ වීයයි.

(ආ) ජලය බැඳීම :—වී වගාවේදී හානිකරන ගොඩ වෙල්ලා මර්ධනයට ජලය පුරවා කඩාහැරිය හැකි අතර බී.ඌරා මර්ධනටය ජලය බැඳ තබන්න.

4. ජීව විද්‍යාත්මක ක්‍රම—

මෙහිදී කෙරෙන්නේ අපට හානි කර කෘමීන්ගේ ජවන චක්‍රයේ එක් එක් අවස්ථාවන් වලට වෙනත් කෘමීන් විසින් හානිකර විනාශකර දැමීමයි. මෙම පරපෝෂිතයින් වගාවේ බෝකිරීමෙන් හානිකර කෘමීන් වඳවී යයි. උදහරණයක් වශයෙන් ගතහොත් එක්තරා කෘමි විශේෂයක් ඔවුන්ගේ බිත්තර දමන්නේ පුරුක් පනු බිත්තරකැදල් තුලය. එවිට එම බිත්තර කැදූල් ලේ විනාශ වී යන අතර ඒ තුලින් පරපෝෂිත කෘමීන් බිහිවේ.

5. කෘමීන් මගින් පැලනය

(අ) කෘමීන් වඳ භාවයට පත් කිරීම:—රසායනික ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් කල යුතුය.

(ආ) එක් පාර්ෂවයකට අයත් කෘමීන් එකතු කිරීම:—මෙය සිදු කෙරෙන්නේද එක්තරා රසායනික සංයෝගයක් මගිනි. උදහරණයක් වශයෙන්, කුකුඹිමේසි කුලයේ එළවළු වලට හානිකරන ඉල්මැස්සා පාලනය කිරීම සඳහා මේ ක්‍රමය උපයෝගී කර ගනී. මෙහිදී එම රසායනික ද්‍රව්‍යයය ඉල් මැස්සාගේ ගැහැණු සතාගේ සුවඳට සමාන සුවඳක් විහිදුවයි. උගුලක් වැනි උපකරණයක් මෙම ද්‍රව්‍යය තැන්පත් කර වගාවේ තැනින් තැන තැබීමෙන් එහි සිටින සියළුම පිරිමි මැස්සන් මේ උපකරණය වෙත එකතු වේ. පසුව මොවුන් එකතු කර විනාශ කර දැමිය හැක. පිරිමි සතුන් අඩු නම් බෝවීමද අඩුය.



ගොවිතැන මැනවින් කිරීමට පරිසරය රැකගැනීමක් අවශ්‍ය වේ.